සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper | I - II | පැය / மணித்தியாலம் / Hours | 3 |
|---|---|---|---|---|---|---|---|

## සංගීතය (පෙරදිග) II

❖ පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. අංක i සිට x තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

   i. මගු සරිස,ධනිුස...මෙම ස්වර සංගතියෙහි රිෂභය සහ ධෛවතය කෝමළ වූ විට අයත් වන රාගය කුමක් ද?

   ii. විකෘති ස්වර දෙකක් පමණක් යෙදෙන නිර්දේශිත රාගය කුමක් ද?

   iii. "කොබෝ කුරුලු වනේ " මෙම ගී පාදයේ සඳැස්මත් ගණන කීය ද?

   iv. නිර්දේශිත පහතරට සින්දු වන්නමේ මුල් ගී පාදය ලියන්න.

   v. න, ධ , තු , ධි යන අක්ෂර පමණක් භාවිතයෙන් නිර්මාණය වී ඇති හින්දුස්ථානී තාලයේ නම කුමක් ද?

   vi. කණ්ඩායම් සංගීතයෙන් ශ්‍රී ලාංකේය සංගීතය වර්ණවත්කළ ප්‍රසිද්ධ සංගීත කණ්ඩායම් දෙකක නම් ලියන්න.

   vii. ඇසේ මධුර ජීවනයේ ගීතා , එන්ඩද මැණිකේ මමත් දියඹටා යන ගීතවල ගායන ශිල්පියා කවුද?

   viii. "උච්ච තිව්‍ර මධ්‍යමය" ස්වර නාමයේ සංකේතය ලියා දක්වන්න.

   ix. ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක පළමු පාදය ලියන්න.

   x. තබ්ලාවේ බායාව සහ දහිනා යන කොටස් දෙකම එකවර භාවිතයෙන් උපදවා ගත හැකි අවනද්ධ අක්ෂර දෙකක් නම් කරන්න.

   ලකුණු 12යි.

2. නිර්දේශිත රාග දෙකක ලක්ෂණ පහත දැක්වේ .

| A | B |
|---|---|
| • ධෛවතය වාදී ස්වරය වේ. | • විකෘති ස්වර දෙකක් පමණක් යෙදේ. |
| • ගාන සමය දිනයේ ප්‍රථම ප්‍රහරය වේ. | • සංවාදී ස්වරය ෂඩ්ජය වේ. |

   i. A සහ B අක්ෂරවලට අදාළ නිර්දේශිත රාග දෙක පිළිවෙළින් නම් කරන්න. ලකුණු 2යි.

   ii. ඉහත රාග දෙකෙන් එකකට අයත් මධ්‍ය ලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස නියමිත තාල සංඥා සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. ලකුණු 6යි.

   iii. ඉහත ii.කොටස සඳහා ඔබ තෝරා නොගත් රාගයට අදාළව මාත්‍රා 8බැගින් වූ තානාලංකාර දෙකක් ලියා දක්වන්න. ලකුණු 4යි.

   මුළු ලකුණු 12යි.

**3.** නිර්දේශිත රාග පහට අයත් ස්වර සංගති පහත දැක්වේ.

A. ස̇ ධ ප , ග ප ධ ප , ග රි ස ධ̣

B. රි ගු̲ රි ම , ගු̲ රි ස , ස රි ප

C. ග රි නි̣ රි ස , නි̣ ධ̣ නි̣ රි ස

D. ස රි̲ ගු̲ ම , ගු̲ රි̲ ස ධ̣̲ නි̣̲ ස

E. ධ නි ස̇ නි ධ ප , ම ග ම රි , ස රි ස

i. ඉහත ස්වර පාද අයත් රාග නම් කරන්න.

A.................... B.................... C.................... D.................... E....................

ලකුණු 5යි.

ii. C හෝE රාග දෙකෙන් එකක ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී, ජාතිය, ගාන සමය ලියා දක්වන්න. ලකුණු 3යි.

iii. හින්දුස්ථානි සංගීතයේ භාවිත පහත සඳහන් පාරිභාෂික පද අතුරෙන් දෙකක් පැහැදිලි කරන්න.
අනුවාදී ස්වර, වර්ජිත ස්වර, විවාදි ස්වර, විකෘති ස්වර. ලකුණු 4යි.

මුලු ලකුණු 12යි.

**4.**




i ඉහත සඳහන් වගුවේ 1 සිට 10 තෙක් හිස්තැන් සඳහා පිළිතුරු සපයන්න. ලකුණු 5යි.

ii ආසාතාත්මක හා අනාසාතාත්මක ගී නිදසුන් සහිතව විස්තර කරන්න. ලකුණු 4යි.

iii ඔබ කැමති ජන ගීයක මුල් පාද දෙක නියමිත තිත් සංඥා සහිතව පද ප්‍රස්තාර කරන්න. ලකුණු 3යි.

මුලු ලකුණු 12යි.

All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper | I - II | පැය / மணித்தியாலம் / Hours | 3යි |
|---|---|---|---|---|---|---|---|

## සංගීතය (පෙරදිග) I

**සැලකිය යුතුයි :**

**(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 2 3 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

**(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

**(1).** කල්‍යාණ ථාට්යෙන් (මේලයෙන්) බිහිවන රාග යුගලයකි.
1. යමන් , බිලාවල්  2. කාෆි , යමන්  3. යමන් , භූපාලි  4. භූපාලි , බිලාවල්

**(2).** සගරිස , රිමගරි , ගපමග , ............ මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර තෝරන්න.
1. මධපම  2. පධපම  3. මපමධ  4. පධමප

**(3).** මිස්රාබය ආධාරයෙන් හඬ නිපදවන හින්දුස්ථානි ස්වර වාද්‍ය භාණ්ඩය වනුයේ,
1. වයලීනයයි.  2. සිතාරයයි.  3. එස්රාජයයි.  4. දිල්රුබාවයි.

**(4).** භෛරවී සහ බිලාවල් යන රාග දෙක සඳහා පොදු ලක්ෂණයකි.
1. ගාන සමය රාත්‍රී ප්‍රථම ප්‍රහරය වීම.  2. සම්පූර්ණ ජාතියට අයත් වීම.
3. වාදී ස්වරය ධෛවතය වීම.  4. විකෘති ස්වර හතරක් යෙදීම.

**(5).** හාර්මෝනියම් නමින් හඳුන්වනු ලබන ස්වර පුවරු වාද්‍ය භාණ්ඩය වනුයේ,
1. මෙලෝඩිකාවයි.  2. එකෝඩියනයයි.  3. සර්පිනාවයි.  4. පියානෝවයි.

**(6).** සුනිල් සාන්තයන්ගේ ගී තනු ඇතුළත් ශ්‍රී ලාංකේය සලකුණ සනිටුහන් කළ චිත්‍රපටය කුමක් ද?
1. සත්සමුදුර  2. අශෝකමාලා  3. සැඩ සුළං  4. රේඛාව

**(7).** රිගු, ධනි යන ස්වර අනුවාදී ස්වර වනුයේ ,
1. යමන් රාගයේ ය.  2. බිලාවල් රාගයේ ය.  3. භෛරවී රාගයේ ය.  4. කාෆි රාගයේ ය.

**(8).** රවි ශංකර් නම් ලෝ පතල සංගීතඥයා හා සම්බන්ධ වාද්‍ය භාණ්ඩය වනුයේ,
1. වයලීනයයි.  2. සිතාරයයි.  3. තබ්ලාවයි.  4. බටනලාවයි.

**(9).** "හෙළ ගී මග" නම් වූ ජන සංගීත පර්යේෂණ කෘතියේ නිර්මාතෘ වනුයේ,
1. සී. ද. එස්. කුලතිලක මහතා ය.  2. සුනිල් ආරියරත්න මහතා ය.
3. ඩබ්ලිව්. බී. මකුලොළුව මහතා ය.  4. රෝහණ බැද්දගේ මහතා ය.

(10). සරි ගප ධසා ධප / ගප ධප ගරි සා මෙම තානාලංකාරය කුමන රාගයට අයත් ද?

1. බිලාවල් 2. භූපාලි 3. යමන් 4. කාෆි

(11) සංධ්වනි ලක්ෂණ විදහා පාමින් සංගීත නිර්මාණය වූ චිත්‍රපට ගීයකි.

1. සිනිඳු සුදු මුදු තලාවේ.
2. පිපි පිපි රේණු නටන.
3. ගලන ගඟකි ජීවිතේ.
4. ඔලු නෙළුම් නෙරිය රහාලා.

(12) විකෘති ස්වර එකක් පමණක් යෙදෙන සම්පූර්ණ ජාති රාගයක් වනුයේ,

1. කාෆි ය. 2. භූපාලි ය. 3. භෛරවී ය. 4. යමන් ය.

- පහත දී ඇති තොරතුරු ඇසුරෙන් **13** සිට **16** තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A. මාත්‍රා 2 සහ 3 වශයෙන් විභාග වේ.
B. මැදුම් මහ දෙතිත ට අනුව මාත්‍රා කැටිවන හින්දුස්ථානි තාලයයි.
C. ආවර්තයක් විභාග හතරකින් යුක්ත වේ.
D. සමග්‍රහය සහ ඛලි ස්ථානය පමණක් යෙදේ.

(13) ත්‍රි තාලය සහ ජප් තාලය සඳහා පොදු ලක්ෂණයක් වනුයේ,

1. A ය. 2. B ය. 3. D ය. 4. C ය.

(14) B වගන්තිය හා සම්බන්ධ වනුයේ,

1. කෙහෙර්වා තාලයයි. 2. දීප්චන්දි තාලයයි. 3. ත්‍රි තාලයයි. 4. ජප් තාලයයි.

(15) D වගන්තිය හා ගැලපෙන නිර්දේශිත තාල ඇතුළත් වරණය තෝරන්න.

1. ඩෙම්ටො , දාදරා , කෙහෙර්වා
2. දාදරා , ත්‍රීතාල් , දීප්චන්දි
3. කෙහෙර්වා , ජප් තාල් , ඩෙම්ටො
4. ජප් තාල් , දීප්චන්දි , දාදරා

(16) A වගන්තියට උචිත ගී පාදය තෝරන්න.

1. තරු කැට අහසේ මුතු ඇට වෙරළේ
2. විල් දියේ මල් පිපී
3. පුංචි නංගි මලක් වගේ
4. සීත සුළඟේ ලඳළු සෙලවේ

(17) මනමේ සහ සිංහබාහු යන නාට්‍ය පිළිබඳ වඩාත් නිවැරදි කියමන කුමක් ද?

1. නාඩගම් ශෛලියේ ආභාසය ලබා ඇත.
2. පහතරට ශාන්ති කර්ම ලක්ෂණ අන්තර්ගත ය.
3. බටහිර සංගීතයේ ආභාසය ලබා ඇත.
4. තබ්ලාව ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස යොදා ගනියි.

(18) "සෝමාව දේ මෙපුර සිරි විසිතුරු"...... යන ගීතය ඇතුළත් නව නාට්‍ය කුමක් ද?

1. අබුද්දස්ස කෝලම
2. රාජකපුරු
3. රතු හැට්ටකාරි
4. තාරාවෝ ඉගිලෙති

(19) රාගයක් බිහිවීමට මූලික වන ස්වර මාලාව හඳුන්වනුයේ,

1. පල්ටා නමිනි.
2. ආරෝහණ නමිනි.
3. ථාට්‍ය නමිනි.
4. අනුවාදී නමිනි.

(20) ගරිගපධනිස, මගමරිසරිස ආදී වශයෙන් ස්වර සංගති යෙදෙනුයේ,

1. භූපාලි රාගයේ ය. 2. බිලාවල් රාගයේ ය. 3. යමන් රාගයේ ය. 4. කාෆි රාගයේ ය.

5. හින්දුස්ථානි තාල පද්ධතියේ තාල දෙකකට අයත් විස්තර පහත A සහ B යටතේ දැක්වේ.

| A | B |
|---|---|
| * විභාග හතරකින් යුක්ත ය.<br>* 9 වන මාත්‍රාව මත බලි ස්ථානය පිහිටුවයි.<br>* එක් විභාගයකට මාත්‍රා 4 ක් ඇත. | * විභාග දෙකකින් යුක්ත ය.<br>* 5වන මාත්‍රාව මත බලි ස්ථානය පිහිටුවයි.<br>* එක් විභාගයකට මාත්‍රා 4 ක් ඇත |

i. A සහ B යන තාල නම් කරන්න. ලකුණු 2යි.

ii. එම තාල අතුරෙන් එකකට අයත් ඨේකාව (තාල පදය) නිමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. ලකුණු 3යි.

iii. ඉහත තාලයන්ට අදාළව මාත්‍රා 4 බැගින් කැටි වන (ආඝාත වන) දේශීය තිත් රූපය නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.(උඩරට හෝ පහතරට හෝ සබරගමු හෝ බෙර පදයක් ප්‍රස්තාර කළ යුතුය)

ලකුණු 3යි.

iv. තබ්ලාවේ බායාවෙන් හා දහිනාවෙන් උපදින අක්ෂර දෙක බැගින් වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. ලකුණු 4යි.

මුළු ලකුණු 12යි.

6.

i. නාඩගම් හා නූර්ති නාට්‍යවල සංගීතමය ලක්ෂණ පිළිබඳව සංසන්දනාත්මකව පහදන්න. (කරුණු හතරක් සෑහේ.) ලකුණු 4යි.

ii. කෝළම් හෝ සොකරි නාට්‍ය ගීතයක පදමාලාව ලියන්න. ලකුණු 4යි.

iii. ග්‍රැමෆෝන් ගී හෝ කපිරිඤ්ඤා ගී පිළිබඳ සුවිශේෂී ලක්ෂණ හතරක් සඳහන් කරන්න. ලකුණු 4යි.

මුළු ලකුණු 12යි.

7. පහත දැක්වෙන අපරදිග සංගීත ස්වර ප්‍රස්තාරය ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. ඉහත බටහිර සංගීත ප්‍රස්තාරයට අදාළ time signature කුමක් ද? ලකුණු 1යි.

ii. ඉහත ප්‍රස්තාරය කුමන ස්කේලයට (scale) අයත් දැයි ලියා දක්වන්න. ලකුණු 1යි.

iii ඉහත අපරදිග සංගීත ප්‍රස්තාරය පෙරදිග සංගීත ප්‍රස්තාර ක්‍රමයට ප්‍රස්තාර කරන්න. ලකුණු 8යි.

iv. බටහිර සංගීතයේ භාවිත පහත සඳහන් පාරිභාෂික පද අතුරෙන් එකක් පිළිබඳව කෙටියෙන් පහදන්න.

1. Rest Notes 2. Short Staff 3. Semibreve ලකුණු 2යි .

මුළු ලකුණු 12යි.

(21) උච්ච-නීච භේදය , රූප භේදය , ජාති භේදය යනු නාදයේ ත්‍රිවිධ ගුණයන්ය. මේවා විද්‍යාත්මකව හඳුන්වන නාම පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.

1 . ධ්වනි ගුණය, තාරතාවය, විපුලතාවය
2. තාරතාවය, විපුලතාවය, ධ්වනි ගුණය
3. විපුලතාවය, ධ්වනි ගුණය, තාරතාවය
4. විපුලතාවය, තාරතාවය ,ධ්වනි ගුණය

(22) නිර්දේශිත රාග අතුරෙන් සම්පූර්ණ ජාතියට අයත් නොවන රාගය කුමක් ද?

1. බිලාවල්
2. කාෆි
3. භූපාලි
4. භෛරවි

(23) අනාසාතාත්මක ගීත ඇතුළත් වරණය තෝරන්න.

1. ගැල් ගී , නෙළුම් ගී , දරු නැළවිලි ගී
2. පාරු ගී , කමත් ගී , කුන්සරණේ ගී
3. ගොයම් ගී , මේවර ගී , පතල් ගී
4. ගැල් ගී , පතල් ගී , පැල් ගී

(24) ගාන්ධාරය වාදී සහ ගාන්ධාරය සංවාදී වන රාග පිළිවෙළින් යෙදෙන වරණය තෝරන්න.

1. යමන් , බිලාවල්
2. යමන් , භූපාලි
3. භූපාලි , යමන්
4. බිලාවල් , යමන්

(25) සමාජයීය ගී ගණයට අයත් වනුයේ,

1. බැති ගී හා කෙළි ගී ය.
2. දරු නැළවිලි ගී හා මෙහෙ ගී ය.
3. මෙහෙගී හා ඇඳහිලි ගී ය.
4. කෙළි ගී හා දරු නැලවිලි ගී ය.

(26) පුද්ගලයින් දෙදෙනෙකුගේ හඬ වෙන්කර හඳුනා ගැනීමට හැකි වනුයේ නාදයේ ඇති කුමන ගුණය නිසා ද?

1. ධ්වනි ගුණය
2. තාරතාවය
3. විපුලතාවය
4. රූප භේදය

(27) භෛරවි රාගාශ්‍රිත සරල ගියක් වනුයේ,

1. මන්නාරම් පිටි වැල්ලේ ගීතයයි.
2.සාදු දන්ත දා ගීතයයි.
3. කවුරුදෝ අර කවුළුවෙන් ගීතයයි.
4. සරුංගලේ වරල් සැලේ ගීතයයි.

(28) ආරෝහණයේ ස්වර පහක් සහ අවරෝහණයේ ස්වර හතක් යෙදෙන රාගයක ජාතිය වනුයේ,

1. ඖඩව සම්පූර්ණ ය.
2. ෂාඩව සම්පූර්ණ ය.
3. ඖඩව ෂාඩව ය.
4. ෂාඩව ඖඩව ය.

(29) භූපාලි රාගයේ ගාන සමය වනුයේ,

1. දිනයේ ප්‍රථම ප්‍රහරයයි.
2. දිවා දෙවන ප්‍රහරයයි.
3. රාත්‍රි ප්‍රථම ප්‍රහරයයි.
4. රාත්‍රි තුන්වන ප්‍රහරයයි.

(30) නූතන ලෝකයේ සිම්ෆනි ඔකෙස්ට්‍රා සඳහා ප්‍රචලිත සංගීතඥයා වනුයේ,

1. ඉතාලි ජාතික යානි සංගීතඥයා ය.
2. වුල්ෆ් ගැන්ග් අමදියෙස් මෝසාට් සංගීතඥයා ය.
3. ලුඩ්විග් වැන් බිතෝවන් සංගීතඥයා ය.
4. ඒ.ආර්.රහමන් සංගීතඥයා ය.

(31) නූතන විද්‍යුත් සංගීත භාණ්ඩ සහ සංගීත නිර්මාණය සඳහා යොදා ගන්නා පරිගණක මෘදුකාංග අතර දත්ත හුවමාරු වන සුලබ ක්‍රමය කුමක් ද?

1. MIDI
2. WAVE
3. MP3
4. AUDIO

පහත දැක්වෙන රූප සටහන් ඇසුරෙන් 32 - 36 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A B C D

**(32)** කෝකිල වන්නම සඳහා වාදනය කරනු ලබන තාල වාද්‍ය භාණ්ඩය වනුයේ,

1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

**(33)** පසන් සහ වාපු තාල වාදනය කරනු ලබන තාල වාද්‍ය භාණ්ඩය වනුයේ,

1. B ය. 2. A ය. 3. D ය. 4. C ය.

**(34)** නූර්ති ගී සඳහා තාල වාදනයට යොදා ගනියි.

1. A 2. C 3. B 4. D

**(35)** ආනත සහ විතතානත වර්ග වලට අයත් දේශීය තාල වාද්‍ය භාණ්ඩ යුගලය පිළිවෙලින්,

1. D සහ C වේ. 2. A සහ B වේ. 3. B සහ C වේ. 4. C සහ D වේ.

**(36)** D හි දැක්වෙන වාද්‍ය භාණ්ඩය වාදනය කරමින් ඉදිරිපත් කරනු ලබන නාට්‍ය විශේෂය වනුයේ,

1. නාඩගම් ය. 2. සොකරි ය. 3. නූර්ති ය. 4. කෝළම් ය.

අංක 37 සහ 38 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත බටහිර සංගීත ප්‍රස්තාරය ඇසුරු කර ගන්න.



1 2 3

**(37)** ඉහත ස්වර ප්‍රස්තාරය පෙරදිග ප්‍රස්තාර ක්‍රමයට ලියූ විට නිවැරදි ස්වර ඛණ්ඩය කුමක් ද?

1. ස - රි / ම - - / ධ - - / ම - -
2. ස ස රි / ම ම - / ප ධ ම / ම ම ම
3. ස - රි / ම - - / + ධ - / පධ ම ප
4. ස රි - / ම - ම / පධ - ම / + + ම

**(38)** ඉහත ස්වර ප්‍රස්තාරයේ 1 , 2 , 3 අංකවලින් වලින් දැක්වෙන සංකේත හඳුන්වන්නේ,

1. Time Signature , Tie , Dotted Note නමිනි.
2. Treble Clef , Time Signature , Tie නමිනි.
3. Time Signature , Dotted Note , Crotchet Rest නමිනි.
4. Treble Clef , Crotchet Rest , Time Signature නමිනි.

**(39)** C Major Chord හා F Major chord පිළිවෙලින්,

1. FAC සහ CEG වේ. 2. CEG සහ FAC වේ. 3. FAC සහ GBD වේ. 4. GBD සහ FAC වේ.

**(40)** ශබ්දය ග්‍රහණය කරගැනීම සඳහා උපයෝගී කරගන්නා තාක්ෂණික මෙවලම වනුයේ,

1. Amplifier (ඇම්ප්ලිෆයර්) ය. 2. Speaker (ස්පීකර් ) ය.
3. Mixer (මික්සර් ) ය. 4. Microphone (මයික්‍රොෆෝන්) ය.

## 11 ශ්‍රේණිය - පෙරදිග සංගීතය

### පිළිතුරු 1 පත්‍රය

| ප්‍රශ්න අංකය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිළිතුරු අංකය | **3** | **1** | **2** | **2** | **3** | **4** | **4** | **2** | **3** | **2** | **1** | **4** | **4** | **2** | **1** | **2** | **1** | **4** | **3** | **2** |
| ප්‍රශ්න අංකය | 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 | 31 | 3 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | 40 |
| පිළිතුරු අංකය | **2** | **3** | **4** | **1** | **4** | **1** | **3** | **1** | **3** | **3** | **2** | **3** | **1** | **2** | **3** | **3** | **2** | **4** | **1** | **1** |

### පිළිතුරු 11 පත්‍රය

(1)

i. භෛරවි ල.1
ii. කාෆි ල.1
iii. 9 ල.1
iv. සේවිත පාද සරෝරුහ සංජිත ල.1
v. දාදරා (ධධින ධතුන) ල.1
vi. ලොස් කැබෙලරොස්./ලා සිලනියන්ස්/මී මැස්සෝ/සමනලයෝ/මූන්ස්ටෝන්/ආදී ල.2
vii. ආනන්ද සමරකෝන් මහතා ල.1
viii. ʻi ල.1
ix. ශුද්ධ ස්වර ස්ථාපන ගීයක මුල් පාදය ලියා තිබීම ල.1
x. ධ , ධි, ධිං , /අක්ෂර දෙකක් සඳහා + ල.2
ලකුණු 12

(2)

2.i රාග දෙක නිවැරදිව නම් කිරීම.

A. බිලාවල් B. කාෆි ලකුණු 2 යි.

2.ii මධ්‍ය ලය ගීතයක/ වාදිතයක ස්ථායි කොටසේ ස්වර ප්‍රස්තාරය නිවැරදි තාල සලකුණු සහිතව ලිවීම (තාල සලකුණු නොමැති නම් ලකුණක් අඩු කරන්න-සර්ගම් ගීතයක් ලියූවද නිවැරදි සේ සලකන්න) ලකුණු 6 යි.

2.iii මාත්‍රා 8 ක තානාලංකාර දෙකක් නියමිත ස්වර සංකේත සහිතව ලිවීම +ලකුණු 4 යි.
ලකුණු 12 යි.

(3)

3.i Aභූපාලි B. කාෆි C.යමන් D.භෛරවී E.බිලාවල් ලකුණු 5 යි.

3.ii තෝරාගත් රාගය නම් කර ඊට අදාළව ආරෝහණ, අවරෝහණ, වාදී සංවාදී ,ජාතිය, ගාන සමය යන කරුණු නිවැරදිව ලිවීම (1/2x6) ලකුණු 3යි.

3.iii පාරිභාෂික පද දෙකක්උදාහරණ සහිතව නිවැරදිව පැහැදිලි කර තිබීම (2 x 2) + ලකුණු 4යි.
ලකුණු 12 යි.

(4)

4.i 1.සේ ගී

2/3. ප්‍රශස්ති, හටන්, ජයමංගල, සන්දේශ කාව්‍ය, වැලපුම් ගී, විරුදු

4. ගැමි ගී

5. මෙහෙ ගී

6. ගැල්, පැල්, පතල්, බඹර, නෙළුම් ආදී නිවැරදි එකක් ලිවීම

7/8. තුන්සරණේ ගී, බැති ගී, ශාන්තිකර්ම ගී ආදී

9. සමාජයීය ගී

10. කෙළි ගී, ඔලිඳ කෙළිය, මේවර කෙළිය, ඔන්චිලි වාරම් ආදී වශයෙන්
ලියූවද නිවැරදි සේ පිළිතුර සලකන්න. 1 – 10 තෙක් (1/2 x 10) ලකුණු 5යි.

4.ii උදාහරණ දක්වමින් ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගී පිළිබඳව නිවැරදි කරුණු සටහන් කිරීම.
(2 x 2) ලකුණු 4යි.

4.iii තෝරාගත් ජන ගීයක මුල් පාද දෙකක නිවැරදි පද ප්‍රස්ථාරය ලිවීම. ලකුණු 2යි.
තිත් සංඥා. ලකුණු 1යි. } + ලකුණු 3යි.

ලකුණු 12 යි.

(5)

5.i A. ත්‍රිතාලය B. කෙහෙර්වා තාලය ලකුණු 2යි.

5.ii තෝරාගත් තාලයේ ඒකාව නිවැරදිව සටහන් කරමින් ප්‍රස්තාර කිරීම.ලකුණු 2යි.
තාල ලකුණු සඳහා. ලකුණු 1යි. } ලකුණු 3යි.

5.iii උඩරට /පහත රට / සබරගමු / සම්ප්‍රදායයන් එකකට අදාළ බෙර පදයක් නිවැරදිව
ප්‍රස්තාර කිරීම. ලකුණු 2යි.
තිත් සංඥා. ලකුණු 1යි. } ලකුණු 3යි.

5.iv බායාව - ගෙ / ගි / කත් / ක
දහිනා - න / ත / තිං / තු / ට ආදී නිවැරදි අක්ෂර දෙක බැගින් වෙන් ව ලිවීම. (2 x 2) + ලකුණු 4යි.

ලකුණු 12 යි.

(6)

6.i සංගීතමය ලක්ෂණ සංසන්දනය වන සේ ඉදිරිපත් කිරීම විය යුතුයි. කරුණු හතරක් ලිවීම සෑහේ.
(තාල/ වාද්‍ය භාණ්ඩ /සංගීතඥයන්/ ගීත/ සංගීත ශෛලීන්/ ගී ආකෘතිය වැනි කරුණු) ලකුණු 4යි.

6.ii කෝලම් /සොකරි මින් එක් ගීයක පද මාලාව නිවැරදිව ලිවීම. ලකුණු 4යි.

6.iii ග්‍රැමෆෝන් ගී /කපිරිඤ්ඤා ගී. මින් එකකට අදාළව සුවිශේෂී ලක්ෂණ හතරක් නිවැරදිව
ලිවීම.( ගීත/ ශිල්පීන්/ වාද්‍යභාණ්ඩ/ භාෂාව/ යුගය /ආදිය පිළිබඳ කරුණු සහ

මාතෘකාවට අදාල වෙනත් සුවිශේෂී කරුණු ) + ලකුණු 4යි.

ලකුණු 12 යි.

(7)

7.i - 3/4 - three four time signature ලකුණු 1යි.

7.ii - F Major Scale ලකුණු 1යි.

7.iii - ස රි ග / ම - රි / j - රි / ස - ස

ධ ධ ප / ම - ප / මප ධ ම / ම - - ලකුණු 8යි.

7.iv

Rest Notes

විරාම ලකුණු සටහන් කිරීම සඳහා යොදා ගනී .

පහත සංකේත භාවිත කරයි .(උදාහරණ කිහිපයකි.)







crotchet rest
**මාත්‍රා 1ක විරාමයක්**

minim rest
**මාත්‍රා 2ක විරාමයක්**

semi breve rest
**මාත්‍රා 4ක විරාමයක්**

මෙම සංකේතයන් ඉදිරියෙන් තිතක් (dot) තැබීමෙන්

Dotted crotchet rest - මාත්‍රා **1 ½ ක විරාමයක්**

Dotted minim rest - මාත්‍රා **3ක විරාමයක්**

Dotted semibreve rest- මාත්‍රා **6ක විරාමයක්**

Short Staff

බටහිර සංගීත ප්‍රස්තාර කරණය සඳහා යොදා ගනී.lines 5 ක් සහ spaces 4 කින් සමන්විතය .

Stave ලෙසද නම් කරයි



Semibreve

මාත්‍රා 4ක වටිනාකමකින් යුතු බව දැක්වීමට යොදාගනී.

මෙම හැඩයෙන් යුතු ය.



Staff මත ස්වර ප්‍රස්තාරකරණය සඳහා යොදා ගනියි.

Rest Notes / Short Staf / Semibreve මින් එක් කොටසක් පැහැදිලි කිරීම සඳහා. + ලකුණු 2යි.

ලකුණු 12 යි.